Department of Education, Sabaragamuwa Province/ Weekly School

විෂය - චිත්‍ර කලාව

මාර්තු 03 සතිය

ශ්‍රේණිය - 10 (I වාරය)

සැකසුම - කේ.කේ.කේ.පොල්වත්ත (නක්කාවිට ක.වි)
දැරණියගල කොට්ඨාසය

**පාඩම/ඒකකය - 5.1.1. සත්ත්ව හා තුරුලතා හැඩ යොදා බිත්ති සැරසිල්ලක් නිර්මාණය කරමු**

1. ඉගෙනුම් ආධාරක



2. ක්‍රියාකාරකමෙහි නිරත වීමට උපදෙස්

– නිර්මාණය සැලසුම් කිරීමේ දී පහත සඳහන් කරුණු පිළිබඳ ව අවධානය යොමු කරන්න

- ඉදිරි පෙනුම, පැති පෙනුම
- අවශ්‍යතාවට ගැළපෙන සේ ගොඩනැගීමට පහසුවන පරිදි සැලසුම් කිරීම
- තෝරාගන්නා ලද මාධ්‍යයන්ට ගැළපෙන මෝස්තර රටා යොදා ගැනීම
- සරල බව සහ ප්‍රායෝගික භාවිතයේ දී ගැටලු අවම වීම

– සැලසුම වර්ණ කිරීමේදී පහත කරුණු පිළිබඳ ව අවධානය යොමු කරන්න

- තෝරාගන්නා ලද මාධ්‍යයට ආවේණික, එහි අනන්‍යතාව තහවුරු වන ලෙස වර්ණ කිරීම
- ආකර්ෂණීය තත්ත්වය, නැවුම් බව රැකෙන පරිදි මූලික සිද්ධාන්ත භාවිතය

3. ඇගයීම

- නිර්මාණාත්මක බිත්ති සැරසිල්ලක් නිර්මාණය සඳහා සුදුසු ද්‍රව්‍ය හඳුනා ගැනීම
- නිර්මාණ කාර්යය සඳහා සත්ත්ව හා තුරුලතා හැඩ, සැරසිලි මොස්තර, පරිසරය ආශ්‍රිත හැඩතල හා ලබා දී ඇති නිදර්ශන උපයෝගී කරගෙන දළ සටහන් ඇඳීම.
- මාධ්‍යයේ ස්වභාවය, භාවිතය, නිර්මාණාත්මක බව පාරිභාරික අවශ්‍යතාව පිළිබඳව අවබෝධයෙන් සැලසුම ගොඩනැගීම හා තමන් තුළ වූ කලාත්මක හැකියා, ශක්‍යතා, නිර්මාණශීලීබව නිර්මාණකරණය සඳහා භාවිතයට ගැනීම